# අභිණ්හ ප්‍රත්‍යවේක්ෂා

# <u>පිළිගැන්වීම</u>

01. ඉමිනා අධිකාරේන - කතේන සුද්ධ චේතසා,
ඥාණාරාම මහාථේරෝ - පාපුණාතු සිවං පදං.

02. ඉමිනා අධිකාරේන - කතේන සුද්ධ චේතසා,
ජිනවංසො මහාථේරෝ - පාපුණාතු සිවං පදං.

03. ධම්මේන නේන මතිසිද්ධ මුදාචිතේන
බුද්ධාදි වත්ථු ගත ධම්ම බලේන සද්ධිං,
ථේරාසභො අරියධම්ම යතින්දනාථෝ
දීඝායුකෝ භවතු සාධු සමිද්ධ චිත්තෝ.

**මේ පුණ්‍ය කර්මය අප සැමගේම ගුරුදෙගුරු උතුමන්හට පූජෝපහාරයක් වේවා !**

# පටුන:


| | |
|---|---|
| රත්නත්‍රය වන්දනාව | 04 |
| දසධම්ම සුත්තං | 05 |
| මහා මංගල සුත්තං | 07 |
| රතන සුත්තං | 10 |
| කරණීය මෙත්ත සුත්තං | 14 |
| ඛන්ධ පරිත්තං | 16 |
| මෝර පරිත්තං | 17 |
| ධජග්ග සුත්තං | 17 |
| ගිරිමානන්ද සුත්තං | 21 |
| ආරක්ෂක පිරිත් සජ්ඣායනා | 24 |
| බොජ්ඣංග පරිත්තං | 25 |
| ඛේමාඛේම සරණ ගමන පරිදීපිකා ගාථා | 25 |
| අරියධන ගාථා | 26 |
| තිලක්ඛණාදි ගාථා | 27 |
| භද්දේකරත්ත ගාථා | 28 |
| සුගතෝවාදය | 29 |
| පච්ඡිම ඕවාද ගාථා | 29 |
| ජය පිරිත | 29 |
| සෙත් ගාථා | 30 |
| උද්දිස්සනාධිට්ඨාන ගාථා | 31 |
| ප්‍රාර්ථනා වාක්‍යය | 32 |
| තෙරුවන් කමා කරගැනීම | 33 |

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස!!!

ඉතිපි සෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී සත්ථා දේව මනුස්සානං බුද්ධෝ භගවා'ති.

බුද්ධං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි. යේ ච බුද්ධා අතීතා ච යේ ච බුද්ධා අනාගතා පච්චුප්පන්නා ච යේ බුද්ධා අහං වන්දාමි සබ්බදා. නත්ථි මේ සරණං අඤ්ඤං බුද්ධෝ මේ සරණං වරං ඒතේන සච්ච වජ්ජේන හෝතු මේ ජය මඞගලං. උත්තමංගේන වන්දේහං පාදපංසු වරුත්තමං. බුද්ධේ යෝ ඛලිතෝ දෝසෝ බුද්ධෝ ඛමතු තං මමං.

ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ අකාලිකෝ ඒහිපස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී'ති.

ධම්මං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි. යේ ච ධම්මා  අතීතා ච යේ ච ධම්මා අනාගතා පච්චුප්පන්නා ච යේ ධම්මා අහං වන්දාමි සබ්බදා. නත්ථි මේ සරණං අඤ්ඤං ධම්මෝ මේ සරණං වරං ඒතේන සච්ච වජ්ජේන හෝතු මේ ජය මඞගලං. උත්තමංගේන වන්දේහං ධම්මං ච තිවිධං වරං. ධම්මේ යෝ ඛලිතෝ දෝසෝ ධම්මෝ ඛමතු තං මමං.

සුපටිපන්නෝ භගවතෝ සාවක සඞ්ඝෝ උජුපටිපන්නෝ භගවතෝ සාවක සඞ්ඝෝ ඤායපටින්නෝ භගවතෝ සාවක සඞ්ඝෝ සාමීචි පටිපන්නෝ භගවතෝ සාවක සඞ්ඝෝ යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨ පුරිස පුග්ගලා ඒස භගවතෝ සාවක සඞ්ඝෝ ආහුණෙයෙයා් පාහුණෙයෙයා් දක්ඛිණෙයෙයා් අඤ්ජලිකරණීයෝ අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සා'ති.

සංඝං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි. යේ ච සඞ්ඝා  අතීතා ච යේ ච සඞ්ඝා අනාගතා පච්චුප්පන්නා ච යේ සඞ්ඝා අහං වන්දාමි සබ්බදා.  නත්ථි මේ සරණං අඤ්ඤං සඞ්ඝෝ මේ සරණං වරං ඒතේන සච්ච වජ්ජේන හෝතු මේ ජය මඞගලං. උත්තමංගේන වන්දේහං සඞ්ඝං ච තිවිධෝත්තමං සඞ්ඝේ යෝ ඛලිතෝ දෝසෝ සඞ්ඝෝ ඛමතු තං මමං.

සංසාර සාරෝඝ විනීත ණිසං - සංණීත සාතං සුවිසාර ධීසං
සංධීරකං සොණ්ණ තනු පලාසං - සංලාප දේසිං පණාමේහි සාසං

සංසාභිගං කේවල මෝහ නාසං - සං නාහකං මාර රණෝ විසේසං
සංසේවිතං දාසි මුදාර භාසං - සංහාර ධම්මං පණාමේ සදාසං

සංදාසගං නාසිත පාප නාසං - සංනාප ධංසිං හත ඝෝර පාසං
සංපාර ගාමිං සුවිසාර වාසං - සංචාර සංඝං පණාමේ රසාසං.

බුද්ධෝ තිලෝක සරණෝ - බුද්ධෝ සුරියෝ තමෝනුදෝ
ඒවං තං සරණං ඛේමං - බුද්ධෝ මේ සරණං වරං
ගච්ඡාමි සරණං බුද්ධං - නත්ථි මය්හං භයං සදා

ධම්මෝ තිලෝක සරණෝ - ධම්මෝ සුරියෝ තමෝනුදෝ
ඒවං තං සරණං ඛේමං - ධම්මෝ මේ සරණං වරං
ගච්ඡාමි සරණං ධම්මං - නත්ථි මය්හං භයං සදා

සංඝෝ තිලෝක සරණෝ - සංඝෝ සුරියෝ තමෝනුදෝ
ඒවං තං සරණං ඛේමං - සංඝෝ මේ සරණං වරං
ගච්ඡාමි සරණං සංඝං - නත්ථි මය්හං භයං සදා

## දස ධම්ම සුත්තං.

ඒවං මේ සුතං ඒකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ. තත්‍ර ඛෝ භගවා භික්ඛූ ආමන්තේසි භික්ඛවෝති. භදන්තේති තේ භික්ඛු භගවතෝ පච්චස්සෝසුං; භගවා ඒතදවෝච. දස ඉමේ භික්ඛවේ ධම්මා පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බා. කතමේ දස ?

01. වේවණ්ණියම්හි අජ්ඣූපගතෝති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

02. පරපටිබද්ධා මේ ජීවිකාති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

03. අඤ්ඤෝ මේ ආකප්පෝ කරණීයෝති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

04. කච්චි නු ඛෝ මේ අත්තා සීලතෝ න උපවදතී'ති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

**05. කච්චි නු ඛෝ මං අනුවිච්චවිඤ්ඤූ සබ්‍රහ්මචාරී සීලතෝ න උපවදන්තී'ති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.**

**06. සබ්බේහි මේ පියේහි මනාපේහි නානාභාවෝ විනාභාවෝති, පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.**

**07. කම්මස්සකෝම්හි, කම්මදායාදෙ, කම්මයෝනි, කම්මබන්ධු, කම්මපටිසරණෝ යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං වා තස්ස දායාදෝ භවිස්සාමීති, පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.**

**08. කථම්භූතස්ස මේ රත්තිං දිවා වීතිපතන්තී'ති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.**

**09. කච්චි නු ඛෝ'හං සුඤ්ඤාගාරේ අභිරමාමී'ති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.**

**10. අත්ථි නු ඛෝ මේ උත්තරිමනුස්සධම්මා අලමරියඤාණ දස්සනවිසේසෝ අධිගතෝ, සෝ'හං පච්ඡිමේ කාලේ සබ්‍රහ්මචාරීහි පුට්ඨෝ න මඞ්කු භවිස්සාමී'ති, පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.**

**ඉමේ ඛෝ භික්ඛවේ දසධම්මා පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බාති. ඉදමවෝච භගවා අත්තමනා තේ භික්ඛූ භගවතෝ භාසිතං අභිනන්දුන්ති.**

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වෙසෙන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි කියා භික්ෂූන් ඇමතූ සේක. භික්ෂූහු එසේය ස්වාමීනි යි කියා භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ දේශනාව වදාළ සේක.

01. මම තව දුරටත් ගිහි ඇවතුම්පැවතුම් හා ආකල්ප වලින් යුක්ත නොවෙමියි ගිහිගෙය හැරගියහුන් විසින් නිතර දෙවේලේ මනාකොට සිහිකටයුතුයි.

02. මාගේ ජීවිතය අන් අයගෙන් යැපෙන ජීවිතයකැයි ගිහිගෙය හැරගියහුන් විසින් නිතර දෙවේලේ මනාකොට සිහිකටයුතුයි.

03. මවිසින් මාගේ පෙර හුරුපුරුදුකම් (ආකල්පයන්) අත්හැර ගැනීම පිණිස වැරවෑයම් කළ යුතුයැයි ගිහිගෙය හැරගියහුන් විසින් නිතර දෙවේලේ මනාකොට සිහිකටයුතුයි.

04. මාගේ කායවාග් සංවරය පිළිබඳව සිත පසුතැවීමක්/දොස්පැවරීමක් කරයිද යැයි ගිහිගෙය හැරගියහුන් විසින් නිතර දෙවේලේ මනාකොට සිහිකටයුතුයි.

05. මාගේ සබ්‍රහ්මචාරීන් වහන්සේලා මාගේ ඇවතුම්පැවතුම්වල දොස් දකිත්දැයි ගිහිගෙය හැරගියහුන් විසින් නිතර දෙවේලේ මනාකොට සිහිකටයුතුයි.

06. මාගේ සියළු ප්‍රිය මනාප දැයින් වෙනස් වීමට වෙන් වීමට සිදුවෙතැයි ගිහිගෙය හැරගියහුන් විසින් නිතර දෙවේලේ මනාකොට සිහිකටයුතුයි.

07. මම කර්මය ස්වකීය කොට ඇත්තෙක් වෙමි, කර්මය දායාද (උරුම) කොට ඇත්තෙක් වෙමි, කර්මයෙන් උපන්නෙක් වෙමි, කර්මය නෑ කොට ඇත්තෙක් වෙමි, කර්මය පිහිට කොට ඇත්තෙක් වෙමි, කුශල වූ හෝ අකුසල වූ හෝ යම් කර්මයක් කරම්ද එයට උරුමක්කාරයා වන්නෙමි යැයි ගිහිගෙය හැරගියහුන් විසින් නිතර දෙවේලේ මනාකොට සිහිකටයුතුයි.

08.ගතවන දිවාරාත්‍රී දෙක්හි මා කෙසේ ප්‍රයෝජනවත් ලෙස කාලය ගතකරත් දැයි ගිහිගෙය හැරගියහුන් විසින් නිතර දෙවේලේ මනාකොට සිහිකටයුතුයි.

09. මා හුදකලා බවෙහි රසවිඳින්නෙක් දැයි ගිහිගෙය හැරගියහුන් විසින් නිතර දෙවේලේ මනාකොට සිහිකට යුතුයි.

10. මාගේ වීයර්‍ය ආයර්‍යඥාණසංඛ්‍යාත දර්ශනයන් ඉපදවීමට සමත්යැයි, එසෙයින් මාගේ අවසාන මොහොතෙහිදී මාගේ සබ්‍රහ්මචාරීන් වහන්සේලා පිළිවිසීමෙහිදී හැකිලීමක්, පැකිලීමක් නොවෙත් දැයි ගිහිගෙය හැරගියහුන් විසින් නිතර දෙවේලේ මනාකොට සිහිකට යුතුයි.

මහණෙනි, මෙම දස ධර්මයෝ ගිහිගෙය හැර පැවිදි වූවහු විසින් එක්වන් නුවණින් සැලකිය යුත්තාහුය.

## මහා මංගල සුත්තං

**එවං මේ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ. අථ ඛෝ අඤ්ඤතරා දේවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කේවල කප්පං ජේතවනං ඕභාසෙත්වා යේන භගවා තේනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං අට්ඨාසි. ඒකමන්තං ඨිතා ඛෝ සා දේවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.**

**01. බහූ දේවා මනුස්සා ච - මංගලානි අචින්තයුං,**
**ආකංඛමානා සොත්ථානං - බ්‍රෑහි මංගලමුත්තමං.**

02. අසේවනා ච බාලානං - පණ්ඩිතානං ච සේවනා,
පූජා ච පූජනීයානං - ඒතං මංගලමුත්තමං.

03. පතිරූපදේස වාසෝ ච - පුබ්බේ ච කතපුඤ්ඤතා,
අත්තසම්මා පණිධි ච - ඒතං මංගලමුත්තමං.

04. බාහුසච්චං ච සිප්පං ච - විනයෝ ච සුසික්ඛිතෝ,
සුභාසිතා ච යා වාචා - ඒතං මංගලමුත්තමං.

05. මාතාපිතූ උපට්ඨානං - පුත්තදාරස්ස සංගහෝ,
අනාකුලා ච කම්මන්තා - ඒතං මංගලමුත්තමං.

06. දානං ච ධම්මචරියා ච - ඤාතකානඤ්ච සංගහෝ,
අනවජ්ජානි කම්මානි - ඒතං මංගලමුත්තමං.

07. ආරති විරති පාපා - මජ්ජපානා ච සඤ්ඤමෝ,
අප්පමාදෝ ච ධම්මේසු - ඒතං මංගලමුත්තමං.

08. ගාරවෝ ච නිවාතෝ ච - සන්තුට්ඨී ච කතඤ්ඤුතා,
කාලේන ධම්ම සවනං - ඒතං මංගලමුත්තමං.

09. ඛන්තී ච සෝවචස්සතා - සමණානඤ්ච දස්සනං,
කාලේන ධම්ම සාකච්ඡා - ඒතං මංගලමුත්තමං.

10. තපෝ ච බ්‍රහ්මචරියං ච - අරියසච්චාන දස්සනං,
නිබ්බාන සච්ඡිකිරියා ච - ඒතං මංගලමුත්තමං.

11. ඵුට්ඨස්ස ලෝකධම්මේහි - චිත්තං යස්ස න කම්පති,
අසෝකං විරජං ඛේමං - ඒතං මංගලමුත්තමං.

12. ඒතාදිසානි කත්වාන - සබ්බත්ථ මපරාජිතා,
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති - තං තේසං මංගලමුත්තමන්'ති.

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වෙසෙන සේක. එකල්හි එක්තරා දෙවියෙක් රාත්‍රිය ඒකාලෝක කොට, ඉතා සිත්කලු ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනාරාමයම බබුලුවා, බුදුරජාණන් වහන්සේ යම් තැනෙක්හි වැඩසිටි සේක් ද එතැනට එළඹියේය. එසේ එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේය. එකත් පසෙක සිටියාවූ ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් මෙසේ සැළ කළේය.

අභිවෘද්ධිය කැමැති වන්නා වූ බොහෝ දෙවියෝ ද මනුෂ්‍යයෝ ද මංගල යනු කවරේදැයි සිතූහ. යහපත කැමතිවන්නාවූ ඔවුනට ඒ උතුම් මංගල කාරණාවන් දේශනා කළ මැනවි.

01. ගුණ හීන අසත්පුරුෂයන් සේවනය නොකිරීමත්
02. නැණවත් සත්පුරුෂයන් සේවනය කිරීමත්
03.පිදිය යුත්තන් පිදීමත් යන මේවා උතුම් මඟුල්ය.

04. සුදුසු ප්‍රදේශයක විසීමත්
05. පෙර කරන ලද පින් ඇති බවත්
06. සිත මනා කොට පිහිටුවීමත් යන මේවා ද උතුම් මඟුල්ය.

07. බහුශ්‍රැතභාවය නම් වූ ධර්මය උගත් කමත්
08. නිවැරදි ශිල්ප දැනුමත්
09. යහපත් ලෙස හික්මීමත්
10. ශිල ශික්ෂාවන් සුරැකිමත්
11. යහපත් වචන භාවිතයත් යන මේවා ද උතුම් මඟුල්ය.

12. මවට පියාට උපස්ථාන කිරීමත්
13. අඹුදරුවන්ට සංග්‍රහ කිරීමත්
14. නිරවුල් කර්මාන්ත ඇති බවත් යන මේවා ද උතුම් මඟුල්ය.

15. දන්දීමත්
16. දශ කුසල ධර්මයෙහි හැසිරීමත්
17. ඥාතීන්ට සංග්‍රහ කිරීමත්
18. නිවැරදි ක්‍රියා ඇති බවත් යන මේවා ද උතුම් මඟුල්ය.

19. පාපයෙන් දුරුවීම හා වැළැකීමත්
20. මත් පැන් බීමෙන් දුරු වීමත්
21. කුසල ධර්මයන්හි අප්‍රමාදයත් යන මේවා ද උතුම් මඟුල්ය.

22. ගරු කටයුත්තන්ට ගරු කිරීමත්
23. යටහත් නිහතමානී පැවතුම් ඇති බවත්
24. ලද පමණින් සතුටුවීමත්
25. කළගුණ දන්නා බවත්
26. සුදුසු කාලයෙහි බණ ඇසීමත් යන මේවා ද උතුම් මඟුල්ය.

27. ඉවසීමත්
28. කීකරු බවත්
29. ශ්‍රමණයන් වහන්සේලා දැකීමත්
30. සුදුසු කාලයෙහි ධර්ම සාකච්ඡා කිරීමත් යන මේවා ද උතුම් මඟුල්ය.

31. තපසත්
32. බඹසර හැසිරීමත්
33. ආර්‍ය්‍ය සත්‍යයන් නුවණින් දැකීමත්
34. නිවන් අවබෝධ කිරීමත් යන මේවා ද උතුම් මඟුල්ය.

35. අෂ්ටලෝක ධර්මයෙන් කම්පා නොවීමත්
36. ශෝක නො කිරීමත්
37. කෙළෙස්වලට නො ඇල්මත්
38. ක්ෂේම (භය රහිත) වීමත් යන මේවා ද උතුම් මඟුල්ය.

මෙබඳු මංගලයන් සිදු කිරීම හේතුවෙන් සියලු තන්හි ක්ලේශයන්ට නොපැරද සියලු ආකාරයේ සැපතට යෙති. ඔවුනට එම අටතිස් කරුණුම උතුම් මඟුල්ය.'යි බුදු රජාණන්වහන්සේ විසින් පිළිවදන් දුන් සේක.

## රතන සුත්තං

01. යානීධ භූතානි සමාගතානී
භුම්මානි වා යානිවා අන්තලික්ඛෙ
සබ්බේව භූතා සුමනා භවන්තු
අථෝපි සක්කච්ච සුණන්තු භාසිතං

02. තස්මා හි භූතා නිසාමේථ සබ්බෙ
මෙත්තං කරෝථ මානුසියා පජාය
දිවා ච රත්තෝ ච හරන්ති යේ බලිං
තස්මාහි නේ රක්ඛථ අප්පමත්තා

03. යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගේසු වා යං රතනං පණීතං
න නෝ සමං අත්ථි තථාගතේන
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

04. ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතෝ
න තේන ධම්මේන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

05. යම්බුද්ධ සෙට්ඨෝ පරිවණ්ණයී සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තේන සමෝ න විජ්ජති
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

06. යේ පුග්ගලා අට්ඨ සතම්පසත්ථා
චත්තාරි ඒතානි යුගානි හොන්ති
තේ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
ඒතේසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථිහෝතු

07. යේ සුප්පයුත්තා මනසා දළ්හේන
නික්කාමිනෝ ගෝතම සාසනම්හි
තේ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථිහෝතු

08. යථින්දඛීලෝ පඨවිංසිතෝ සියා
චතුබ්භි වාතේහි අසම්පකම්පියෝ
තථූපමං සප්පුරිසං වදාමි
යෝ අරියසච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථිහෝතු

09. යේ අරියසච්චානි විභාවයන්ති
ගම්භීර පඤ්ඤේන සුදේසිතානි
කිඤ්චාපි තේ හොන්ති භූසප්පමත්තා
න තේ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථිහෝතු

10. සහාවස්ස දස්සනසම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කායදිට්ඨි විචිකිච්ජිතඤ්ච
සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි
චතූහපායේහි ච විප්පමුත්තෝ
ඡචාභිඨානානි අභබ්බෝ කාතුං
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථිහෝතු

11. කිඤ්චාපි සෝ කම්මං කරෝති පාපකං
කායේන වාචා උද චේතසාවා
අභබ්බෝ සෝ තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨපදස්සවුත්තා
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථිහෝතු

12. වනප්පගුම්බේ යථා ඵුස්සිතග්ගේ
ගිම්භානමාසේ පඨමස්මිං ගිම්හේ
තථූපමං ධම්මවරං අදේසයි
නිබ්බානගාමිං පරමං හිතාය

ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථිහෝතු

13. වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ
අනුත්තරෝ ධම්මවරං අදේසයි
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථිහෝතු

14. ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්තචිත්තා ආයතිකේ භවස්මිං
තේ ඛීණ බීජා අවිරුළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථායං පදීපෝ
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

15. යානීධ භූතානි සමාගතානි
භුම්මානිවායානි ව අන්තළික්ඛේ
තථාගතං දේව මනුස්ස පූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හෝතු

16. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තළික්ඛේ
තථාගතං දේව මනුස්ස පූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හෝතු

17. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තළික්ඛේ
තථාගතං දේව මනුස්ස පූජිතං
සඞ්ඝං නමස්සාම සුවත්ථි හෝතු

1. භූමියෙහි වූ හෝ අහසෙහි වූ හෝ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙහි රැස්ව සිටිත්ද ඒ අමනුෂ්‍යයෝ හැමදෙනා සතුටු සිත් ඇත්තෝ වෙත්වා! නැවත මාගේ මේ වචනය මනාකොට අසත්වා!

2. එහෙයින් සියලු අමනුෂ්‍යයෙනි මාගේ දෙසුම අසවු, මනුෂ්‍ය සමූහයා කෙරෙහි මෛත්‍රී කරවු, යම් මනුෂ්‍ය කෙනෙක් ඔබට රෑ දවල් දෙකේ පුද පූජා පවත්වත්ද එහෙයින්ම ඔවුන් නොපමාව ආරක්ෂා කරවු.

3. මෙලොව හෝ වෙන ලොවක හෝ යම් වස්තුවක් වේ ද, දෙව්ලොව හෝ යම් උතුම් රත්නයක් ඇත්ද, ඒ කොතැනකවත් තථාගත රත්නය හා සම වූවක් නැත. මෙයද බුදුරජාණන් වහන්සේ කෙරෙහි ප්‍රණීතවූ උත්තම වූ රතනභාවයෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා!

4. ශාක්‍ය ගෝත්‍රයෙහි වූ මුනීන්ද්‍රයන් වහන්සේ ආර්‍ය මාර්ග සමාධියෙන් සමාහිතවූ සේක්ද? ඛය-විරාග-අමත-ප්‍රණීත යන ගුණයන්ගෙන් යුක්ත

නිර්වාණයක් ප්‍රකාශ කළ සේක්ද? ඒ නිර්වාණ ධර්මය හා සමවූ අන්කිසිවක් නැත. මෙයද ධර්මය කෙරෙහි ඇති උසස් රත්න භාවයෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා!

5. බුදුරජාණන් වහන්සේ යම් පිරිසිදු ආර්‍ය්‍ය මාර්ගයෙක ගුණ වර්ණනා කළ සේක් ද, යම් ආර්‍ය්‍ය මාර්ගයක් කල් නොයවා විපාක දෙන බැවින් ආනන්තරික සමාධිය යි ප්‍රකාශ කළ සේක් ද ඒ මාර්ග සමාධිය හා සම වූ සමාධියක් වෙන නැත. මෙය ද ධර්මය කෙරෙහි ඇති ශ්‍රේෂ්ඨ භාවයකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා!

6. යම් පුද්ගලයන් අට දෙනෙක් සත්පුරුෂයන් විසින් ප්‍රශංසා කරනු ලද්දහු ද ඔවුහු යුගල වශයෙන් සතර දෙනෙක් වෙති. බුදුරජාණන් වහන්සේගේ
ශ්‍රාවක වූ ඒ ආර්‍යෝත්තම ශ්‍රාවක-යෝ දක්ෂිණාවට සුදුස්සෝ වෙති. මේ උතුමන් කෙරෙහි දුන් දෙය මහත්පල වෙයි. මෙය ද ආර්‍ය්‍ය සංඝයාගේ උසස් බවෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා!

7. යම් රහත් කෙනෙක් මේ ගෞතම බුද්ධ ශාසනයෙහි ස්ථිර සිතින් යෙදුනාහුද, කෙලෙසුන්ගෙන් මිදුනාහු ද ඒ රහත් හු අමෘත සංඛ්‍යාත නිර්වාණයට බැසගෙන, උසස්ම සැනසීම නම්වූ අර්හත් ඵල සුඛය නොමිළයේම ලැබ ඒ සමවත් සුව විඳිති. මෙය ද ආර්‍ය්‍ය සංඝයා කෙරෙහි ඇති උසස් බවෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා!

8. නගරද්වාරයෙහි පොළව සාරා සිටුවන ලද ඉන්ද්‍රඛීලය සතර දිගින් හමන සුළඟින් යම්සේ කම්පා නොවේ ද එසේම යමෙක් ආර්‍ය්‍ය සත්‍යය ප්‍ර ඥාවෙන් නොසෙල්වෙන සේ දකි ද හෙතෙම ඉන්ද්‍රඛීලයක් සේ සමානයි කියමි. ආර්‍ය්‍ය සංඝයා කෙරෙහි ඇති මේ රත්න භාවය ද උතුම් වේ. මේ සත්‍ය බලයෙන් සෙත්ම වේවා!

9. යමෙක් ගැඹුරු නුවණක් ඇති බුදුරජාණන් වහන්සේ මනා කොට දෙසූ ආර්‍ය්‍ය සත්‍ය ධර්මය සිය නුවණින් ප්‍රත්‍යක්ෂ කොට දනිත් ද ඒ සෝවාන් පුද්ගලයෝ ඉදින් අතිශයින් ප්‍රමාද වූවත් අටවන ජාතියක උත්පත්තියක් නො ගනිති. ආර්‍ය්‍ය සංඝයා කෙරෙහි ඇති මේ රත්න භාවය ද උතුම් වේ. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා!

10. ඔහුට දර්ශනසම්පද යැයි කියන ලද සෝවාන් මාර්ග ඥානය පහළවීමත් සමගම සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස යන එම කෙලෙස් තුනම ප්‍රහීණ කරන ලද්දේ වේ. සතර අපායෙන් මිදුණු හේ සැවැදෑරුම් ඖදරික පාපයන් කිරීමට නුසුදුසු වන්නේය. මෙයද ආර්‍ය්‍ය සංඝයා කෙරෙහි ඇති උතුම් බවෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා!

11. ඒ (සෝවාන්) පුද්ගලයා කයින් වචනයෙන් හෝ සිතින් කිසියම් පාප කර්මයක් කරයි ද හෙතෙම එම පාප කර්මය සැඟවීමට නුසුදුසු වන්නේය. එසේ වන්නේ නිවන් දක්නා ලද සෝවාන් පුද්ගලයා එම පාපය සැඟවීමට

නුසුදුසු බව වදාළ නිසාය. මෙයද ආර්‍යය සංඝයා කෙරෙහි ඇති උතුම් බවෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා!

12. ග්‍රීස්ම සෘතුවෙහි ප්‍රථම ග්‍රීස්ම සමයෙහි වන ලැහැබක මොනවට පිපුණු මලින් හෙබි මුදුන් ඇත්තේ යම් සේ ශෝභාවත් වේ ද එසේ උපමා වූ (ස්කන්ධ ධාතු, ආයතනාදී නානාවිධ පුෂ්පයෙන් පිරිපුන් නිවන් මඟට පමුණුවන උතුම් පර්‍යාප්ති) ධර්මය නිවන් පිණිස දෙසන ලදි. මෙය ද බුදුරජාණන් වහන්සේ කෙරෙහි ඇති උතුම් බවෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා!

13. ශ්‍රේෂ්ඨවූ ද උතුම් නිර්වාණය දන්නාවූ ද, උතුම් නිවන් සුව දෙන්නා වූ ද, උතුම් නිවන් මඟට පමුණුවන්නා වූ ද අනුත්තර වූ ධර්මය දේශනා කරන ලදි. මෙය බුදුරජාණන් වහන්සේ කෙරෙහි ඇති උතුම් බවෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා!

14. යම් රහතන් වහන්සේ කෙනෙකුගේ පුරාණ කර්ම ගෙවුණේ වේ ද අලුත් කර්මයන්ගේ හට ගැනීමෙක් නැද්ද, මතුභවයෙහි නො ඇලුණු සිත් ඇත්තාහු ද, ඒ ක්ෂීණාශ්‍රවයෝ ගෙවුණු පුනරුත්පත්ති බීජ ඇත්තාහ, පුනර්භවයෙහි ඇල්මක් නැත්තාහු ධෛර්‍යයෙන් යුක්ත වූ ඒ රහත්හු මේ පහන මෙන් නිවී යන්නාහුය. මෙය ද ආර්‍යය සංඝයා කෙරෙහි ඇති උතුම් බවෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා!

15. භූමියෙහි වූ හෝ අහසෙහි වූ හෝ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙහි රැස්ව සිටිත් ද ඒ අපි හැමදෙනාම දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත බුදුරජාණන් වහන්සේ වඳිමු. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා!

16. භූමියෙහි වූ හෝ අහසෙහි වූ හෝ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙහි රැස්ව සිටිත් ද ඒ අපි හැමදෙනාම දෙව් මිනිසුන් විසින් පුදන ලද නව ලොවුතුරු සදහම් වඳිමු. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා!

17. භූමියෙහි වූ හෝ අහසෙහි වූ හෝ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙහි රැස්ව සිටිත් ද ඒ අපි හැමදෙනාම දෙව් මිනිසුන් විසින් පුදන ලද ආර්‍යය සංඝයා වඳිමු. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා!

## කරණීය මෙත්ත සුත්තං

**01. කරණීයමත්ථ කුසලේන - යන්තං සන්තං පදං අභිසමෙච්ච,**
**සක්කෝ උජූ ච සූජූ ච - සුවචෝ චස්ස මුදු අනතිමානී.**

**02. සන්තුස්ස කෝ ච සුභරෝ ච - අප්පකිච්චෝ ච සල්ලහුකවුත්ති,**
**සන්තින්ද්‍රියෝ ච නිපකෝ ච - අප්පගබ්බෝ කුලේසු අනනුගිද්ධෝ.**

**03. න ච ඛුද්ධං සමාචරේ - කිඤ්චි යේන විඤ්ඤූපරේ උපවදෙයුං,**
**සුඛිනෝ වා ඛේමිනෝ හොන්තු - සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා.**

**04. යේ කේචි පාණ භූතත්ථි - තසා වා ථාවරා වා අනවසේසා,**
**දීඝාවා යේ මහන්තා වා - මජ්ඣිමා රස්සකාණුක ථූලා.**

**05. දිට්ඨා වා යේව අද්දිට්ඨා - යේව දූරේ වසන්ති අවිදූරේ,**
**භූතා වා සම්භවේසී වා - සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා.**

**06. න පරෝ පරං නිකුබ්බේථ - නාතිමඤ්ඤේථ කත්ථචි නං කඤ්චි,**
**බ්‍යාරෝසනා පටිඝසඤ්ඤා - නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය.**

**07. මාතා යථා නියංපුත්තං - ආයුසා ඒකපුත්තමනුරක්ඛේ,**
**ඒවම්පි සබ්බභූතේසු - මානසං භාවයේ අපරිමාණං.**

**08. මෙත්තං ච සබ්බලෝකස්මිං - මානසං භවයේ අපරිමාණං,**
**උද්ධං අධෝ ච තිරියඤ්ච - අසම්බාධං අවේරං අසපත්තං.**

**09. තිට්ඨං චරං නිසින්නෝ වා - සයානෝ වා යාවතස්ස විගතමිද්ධෝ,**
**ඒතං සතිං අධිට්ඨෙය්‍ය - බ්‍රහ්මමේතං  විහාරං ඉධමාහු.**

**10. දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා - දස්සනේන සම්පන්නෝ,**
**කාමේසු විනෙය්‍ය ගේධං - නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරේතී'ති.**

01. ශාන්තපදය නම් වූ නිවනට ප්‍රතිවේධ වශයෙන් පැමිණ වසනු කැමැත්තහු විසින් යමක් කළ යුතු ද දියුණුවෙහි දක්‍ෂයා විසින් එය කළ යුතුය. කටයුතුවල දක්‍ෂයෙකු විය යුතුය. අවංක විය යුතුය. හොඳටම අවංක විය යුතුය. කීකරුවූවකු ද විය යුතුය. මෘදු වූවෙකු ද විය යුතුය. උඩඟු නැත්තෙකුද විය යුතුය.

02. සතුටු වන්නෙකුද විය යුතුය. සුවසේ පෝෂණය කළ හැකි ද විය යුතුය. අල්පවූ කටයුතු ඇත්තකු ද විය යුතුය. සැහැල්ලු පැවතුම් ඇත්තකු ද විය යුතුය. ශාන්තවූ ඉන්ද්‍රියන් ඇත්තකු ද විය යුතුය. තැනට නිසි නුවණ ඇත්තකු ද විය යුතුය. ගොරෝසුකම් නැත්තකු ද විය යුතුය. කුලයන් කෙරෙහි  නො ඇලෙන්නෙකුද විය යුතුය.

03. යම් ක්‍රියාවක් කරණ කොට ගෙන නුවණැති යම් කෙනෙකු අපවාද කරත් ද එබඳු කුඩා හෝ වරදක් නො කටයුතුය. හැම සත්හුම කයිනුත් සුවැත්තෝ වෙත්වා! භය නැත්තෝ වෙත්වා! සුවපත් සිත් ඇත්තෝ වෙත්වා!

04. යම්කිසි ප්‍රාණීහු සමූහයක් වෙත් ද කෙලෙස් ඇතිව තැති ගන්නා සුලු වූ සත්වයෝ ද තැති ගන්නා ස්වභාවය නැති රහත්හූ ද දීර්ඝ සිරුරු ඇති සත්වයෝ ද මහත් සිරුරු ඇති සත්වයෝ ද  මධ්‍යම ප්‍රමාණ සිරුරු ඇති සත්වයෝ ද කුරුවූ හා මිට්වූ සත්වයෝ ද ඉතා සියුම් සත්වයෝ ද ස්ථූල සත්වයෝ ද

05. ඇසට පෙනෙන්නාවූ හා නොපෙනෙන්නාවූ සත්වයෝ ද දුර සිටින්නාවූ හා ළඟ සිටින්නාවූ සත්වයෝ ද ඉපදුනාවූ හා ඉපදෙන්නාවූ සත්වයෝ ද ඒ

සියලු සත්වයෝ සුවපත් වූ සිතැත්තෝ වෙත්වා!

06. එකෙක් අනිකෙකු නොරවටන්නේය. අනෙකෙකුට අවමන් නොකරන්-නේය. කය හා වචනය පිළිබඳ විකෘතියෙන්ද මනෝ විකාරයෙන්ද එකෙක් අනිකෙකට දුකක් නොකැමති වන්නේය.

07. මව යම් සේ තමාගෙන් ඇති වූ එකම පුත්‍රයා ජීවිත පරිත්‍යාගයෙන් වුවත් රක්නේද එපරිද්දෙන්ම සියළු සත්වයන් කෙරෙහි අප්‍රමාණ වූ මෛත්‍රී සහගත සිත වඩන්නේය.

08. උඩද යටද සරසද සීමාවකුදු නැතිව අතරතුරවත් වෛර චේතනා පහළ වීමක් නැතිව, සතුරන් රහිතව සියළු ලෝක සත්වයා කෙරෙහි අප්‍රමාන වූ මෛත්‍රී සහගත සිත වඩන්නේය.

09. සිටින්නේ හෝ ඇවිදින්නේ හෝ හිඳින්නේ හෝ නිඳන්නේ නොනිදා යම් තාක් කල සිටිත්ද ඒ තාක් කල් මෛත්‍රී සහගත සිහිය වඩන්නේය. මෛත්‍රි විහරණය මේ බුද්ධ සාසනයෙහි
ශ්‍රේෂ්ඨ විහරණයකැයි ප්‍රකාශ කළහ.

10. මිසදුටු බවට නොපැමිණ සිල්වත් වූයේ දර්ශණයෙන් යුක්ත වූයේ වස්තු කාමයන්හි ගිජු බව දුරු කොට ඒකාන්තයෙන්ම නැවත මව් කුස විසීමට නොපැමිණෙන්නේය.

## ඛන්ධ පරිත්තං

**විරූපක්ඛේහි මේ මෙත්තං - මෙත්තං ඒරාපථේහි මේ,**
**ඡබ්‍යාපුත්තේහි මේ මෙත්තං - මෙත්තං කණ්හාගොතමකේහි ච.**

**අපාදකේහි මේ මෙත්තං - මෙත්තං දිපාදකේහි මේ,**
**චතුප්පදේහි මේ මෙත්තං - මෙත්තං බහුප්පදේහි මේ.**

**මා මං අපාදකෝ හිංසි - මා මං හිංසි දිපාදකෝ,**
**මා මං චතුප්පදෝ හිංසි - මා මං හිංසි බහුප්පදෝ.**

**සබ්බේ සත්තා සබ්බේ පාණා - සබ්බේ භූතාච කේවලා,**
**සබ්බේ භද්‍රානි පස්සන්තු - මාකඤ්චි පාපමාගමා.**

**අප්පමාණෝ බුද්ධෝ, අප්පමාණෝ ධම්මෝ, අප්පමාණෝ සඞ්ඝෝ, පමාණවන්තානි සිරිංසපානි අහිවිච්ඡිකා සතපදී' උණ්ණානාභි සරබූ මූසිකා, කතා මේ රක්ඛා කතා මේ පරිත්තා, පටික්කමන්තු භූතානි, සෝහං නමෝ භගවතෝ නමෝ සත්තන්නං සම්මාසම්බුද්ධානන්ති.**

# මෝර පරිත්තං

01. (උදේතයං/අපේතයං) චක්ඛුමා ඒකරාජා
හරිස්ස වණ්ණෝ පඨවිප්පභාසෝ,
තං තං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං
තයජ්ජ ගුත්තා විහරේමු (දිවසං/රත්තිං.)

02. යේ බ්‍රාහ්මණා වේදගූ සබ්බධම්මේ
තේ මේ නමෝ තේච මං පාලයන්තු,
නමත්ථු බුද්ධානං නමත්ථු බෝධියා
නමෝ විමුත්තානං නමෝ විමුත්තියා
ඉමං සෝ පරිත්තංකත්වා මෝරෝ (චරති ඒසනා/වාසමකප්පයිති)

# ධජග්ග සුත්තං

01. ඒවං මේ සුතං, ඒකං සමයං භගවා, සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ. තත්‍ර බෝ භගවා භික්ඛූ ආමන්තේසි භික්ඛවෝති. භදන්තේති තේ භික්ඛූ භගවතෝ පච්චස්සෝසුං, භගවා ඒතදවෝච.

02. භූතපුබ්බං භික්ඛවේ දේවාසුර සඞ්ගාමෝ සමුපබ්බූළ්හෝ අහෝසි. අථ බෝ භික්ඛවේ සක්කෝ දේවානමින්දෙ දේවේ තාවතිංසේ ආමනේතේසි, සචේ මාරිසා දේවානං සංගාමගතානං උප්පජ්ජෙය්‍ය භයං වා ඡම්භිතත්තං වා ලෝමහංසෝ වා මමේව තස්මිං සමයේ ධජග්ගං උල්ලෝකෙය්‍යාථ. මමං හි වෝ ධජග්ගං උල්ලෝකයතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලෝමහංසෝ වා සෝ පහීයිය්සති.

03. නො චේ මේ ධජග්ගං උල්ලෝකෙය්‍යාථ, අථ පජාපතිස්ස දේවරාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ, පජාපතිස්ස හි වෝ දෙවරාජස්ස ධජග්ගං උල්ලෝකයතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලෝමහංසෝ වා සෝ පහීයිස්සති. නෝ චේ පජාපතිස්ස දේවරාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ, අථ වරුණස්ස දේවරාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ, වරුණස්ස හි වෝ දේවරාජස්ස ධජග්ගං උල්ලෝකයතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලෝමහංසෝ වා සෝ පහීයිස්සති. නෝ චේ වරුණස්ස දේවරාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ, අථ ඊසානස්ස දේවරාජස්ස ධජග්ගං උල්ලෝකෙය්‍යාථ. ඊසානස්ස හි වෝ දේවරාජස්ස ධජග්ගං උල්ලෝකයතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලෝමහංසෝ වා සෝ පහියිස්සති.

04. තං ඛෝ පන භික්ඛවේ සක්කස්ස වා දේවානමින්දස්ස ධජග්ගං උල්ලෝකයතං, පජාපතිස්ස වා දේවරාජස්ස ධජග්ගං උල්ලෝකයතං, වරුණස්ස වා දේවරාජස්ස ධජග්ගං උල්ලෝකයතං, ඊසානස්ස වා දේවරාජස්ස ධජග්ගං උල්ලෝකයතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලෝමහංසෝ වා සෝ පහීයේථාපි නෝපි පහීයේථ, තං කිස්ස හේතු? සක්කෝ භික්ඛවේ දේවානමින්දෝ අවීතරාගෝ අවීත දෝසෝ අවීත මෝහෝ භීරුච්ඡම්භි උත්‍රාසි පලායීති.

05. අහඤ්ච ඛෝ භික්ඛවේ ඒවං වදාමි; සචේ තුම්හාකං භික්ඛවේ අරඤ්ඤගතානං වා රුක්ඛමූලගතානං වා සුඤ්ඤාගාරගතානං වා උප්පජ්ජෙය්‍ය භයං වා ඡම්භිතත්තං වා ලෝමහංසෝ වා මමේව තස්මිං සමයේ අනුස්සරෙය්‍යාථ;
ඉතිපි සෝ භගවා අරහං ......... බුද්ධෝ භගවාති.

06. මමං හි වෝ භික්ඛවේ අනුස්සරතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලෝමහංසෝ වා සෝ පහීයිස්සති. නෝ චේ මං අනුස්සරෙය්‍යාථ, අථ ධම්මං අනුස්සරෙය්‍යාථ;
ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ ......... විඤ්ඤූහීති.

07. ධම්මං හි වෝ භික්ඛවේ අනුස්සරතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලෝමහංසෝ වා සෝ පහීයිස්සති. නෝ චේ ධම්මං අනුස්සරෙය්‍යාථ, අථ සංඝං අනුස්සරෙය්‍යාථ;
සුපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ ............ලෝකස්සාති.

සංඝං හි වෝ භික්ඛවේ අනුස්සරතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලෝමහංසෝ වා සෝ පහීයිස්සති; තංකිස්ස හේතු? තථාගතෝ භික්ඛවේ අරහං සම්මාසම්බුද්ධෝ වීතරාගෝ, වීතදෝසෝ, වීතමෝහෝ අභීරු අච්ඡම්භි අනුත්‍රාසි අපලායීති. ඉදමවෝච භගවා ඉදං වත්වා සුගතෝ අථාපරං ඒතදවෝච සත්ථා;

08. අරඤ්ඤේ රුක්ඛමූලේ වා, සුඤ්ඤාගාරේව භික්ඛවෝ,
අනුස්සරේථ සම්බුද්ධං භයං තුම්හාක නෝ සියා.

09. නො චේ බුද්ධං සරෙය්‍යාථ ලෝකජෙට්ඨං නරාසභං,
අථ ධම්මං සරෙය්‍යාථ නිය්‍යානිකං සුදේසිතං.

10. නො චේ ධම්මං සරෙය්‍යාථ නීය්‍යානිකං සුදේසිතං,
අථ සඞ්ඝං සරෙය්‍යාථ පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං.

11. ඒවං බුද්ධං සරන්තානං ධම්මං සඞඝඤ්ච භික්ඛවෝ,
භයං වා ඡම්භිතත්තං වා ලෝමහංසෝ න හෙස්සති’ති.

01. (ආනන්ද නම් වූ) මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වෙසෙන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූ සේක. භික්ෂූහු එසේය ස්වාමීනියි කියා භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ දේශනාව වදාළ සේක.

02. මහණෙනි, පෙර සිදුවූ දෙයක් කියමි. දෙවියන් සහ අසුරයන් අතර යුද්ධයක් හටගත්තේය. ඉක්බිති මහණෙනි, ශක්‍රදේවේන්ද්‍ර තෙම තව්තිසා වැසි දෙවියන් ඇමතීය. භවත්නි, ඉදින් යුද්ධයට පැමිණි දෙවියන්ට බියක් හෝ තැතිගැන්මක් හෝ රෝමෝද්ගමනයක් හෝ උපන්නේ නම් එකල්හි මගේ කොඩියේ අග බලවු. එසේ මාගේ කොඩියේ අග බලන්නාවූ ඔබලාට භයක් හෝ තැති ගැනීමක් හෝ රෝමෝද්ගමනයක් හෝ ඇතිවන්නේ නම් එය දුරුවෙයි.

03. ඉදින් මාගේ කොඩිය අග නො බලන්නේ නම් එකල්හි ප්‍රජාපති දෙව්රජහුගේ කොඩිය අග බලවු. ප්‍රජාපති දෙව්රජහුගේ කොඩිය අග බලන නුඹලාට බියක් හෝ තැති ගැනීමක් හෝ ලොමු දැහැගැන්මක් හෝ වේනම් එය දුරුවෙයි. ඉදින් ප්‍රජාපති දෙව්රජහුගේ කොඩිය අග නොබලන්නේ නම් එකල්හි වරුණ නම් දෙව්රජහුගේ කොඩිය අග බලවු. වරුණ දෙව්රජහුගේ කොඩිය අග බලන නුඹලාට යම් බියක් හෝ තැති ගැනීමක් හෝ ලොමුදැහැගැන්මක් හෝ වේ නම් එය දුරුවෙයි. ඉදින් වරුණ දෙව්රජුගේ කොඩිය අග නොබලන්නේ නම් එකල ඊසාන නම් දෙව්රජහුගේ කොඩිය අග බලවු. ඊසාන නම් දෙව්රජහුගේ කොඩිය අග බලන ඔබලාට යම් බියක් හෝ තැති ගැනීමක් හෝ රෝමෝද්ගමනයක් හෝ වේනම් එය දුරුවෙයි.

04. මහණෙනි, සක්දෙව්රජහුගේ හෝ ප්‍රජාපතී දෙව්රජහුගේ හෝ වරුණ දෙව්රජහුගේ හෝ ඊසාන දෙව්රජහුගේ හෝ කොඩිය අග බලන්නවුන්ට යම් භයක් හෝ තැති ගැනීමක් හෝ රෝමෝද්ගමනයක් හෝ වෙයි නම් එය දුරු නොවෙයි. එයට හේතු කවරේද යත් ? මහණෙනි, ඒ සක්දෙව්රජතෙම දුරු නො කළ රාග අත්තේය. දුරු නො කළ ද්වේෂ ඇත්තේය. දුරු නො කළ මෝහ ඇත්තේය. බිය වන සුලුය. තැතිගන්නා සුලුය. අතිශයින්ම බිය වන සුලුය. පලායන සුලුය.

05. මහණෙනි, මම ද නුඹලාට මෙසේ කියමි. මහණෙනි, ඉදින් වනයට ගියාවූ හෝ රුක්මුලකට ගියාවූ හෝ නිදහස් තැනකට ගියාවූ හෝ නුඹලාට භයක් හො තැතිගැනිමක් හෝ ලොමුදැහැගැන්මක් හෝ උපන්නේ වී නම් එකල්හි මා ගැන සිහි කරවු. හේ කෙසේද ? ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙනුදු රහත් නම් වන සේක. සම්‍යක් සම්බුද්ධ නම් වන සේක. විජ්ජාචරණසම්පන්න නම් වන සේක. සුගත නම් වන සේක. ලෝකවිදූ නම් වන සේක. අනුත්තර පුරිසදම්ම සාරථී නම් වන සේක. දෙව් මිනිසුන්ට ශාස්තෘ නම් වන සේක. බුද්ධ නම් වන සේක. භාග්‍යවත් නම්

වන සේක කියායි. මහණෙනි, මාගැන සිහිකරන තොපට යම් භයක් හෝ තැති ගැනීමක් හෝ රෝමෝද්ගමනයක් හෝ වේ නම් එය දුරුවන්නේය.

06. ඉදින් (නුඹලා) මා සිහි නොකරන්නාහු නම් එකල්හි ධර්මය සිහි කරවු. හේ කෙසේද ? භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද ධර්මය තෙමේ මනා කොට දේශනා කරණ ලද්දේය. තමා විසින් දැක්ක යුත්තේය. කල් නොගොසින්ම විපාක දෙන්නේය. එව බලව යි කීමට සුදුසුය. තම සිත් සතන්හි එළවා බැලීමට හෙවත් තමතමන් විසින්ම කල්පනාකර අවබෝධ කරගැනීමට සුදුසුය. නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහිලා දතයුත්තේය. මහණෙනි, මෙසේ ධර්මය සිහිකරන නුඹලාට යම් භයක් හෝ තැති ගැනීමක් හෝ රෝමෝද්ගමනයක් හෝ වේ නම් එය දුරුවන්නේය.

07. ඉදින් ධර්මය සිහි නොකෙරේ නම් එකල්හි සංඝයා සිහි කරවු. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙමේ මනා පිළිවෙත්හි පිළිපන්නේය, ඍජු ප්‍රතිපත්තියෙහි පිළිපන්නේය, නිවණට අනුකූලව පිළිවෙත්හි පිළිපන්නේය, සුදුසු ගරු බුහුමනට පිළිපන්නේය, යම් මේ පුරුෂ යුගල වශයෙන් සතර කොටසක් වෙත් ද පුද්ගල වශයෙන් අෂ්ට ආර්ය පුද්ගලයෝ අට දෙනෙක් වෙත් ද භාග්‍යවතුන් වහන්සේගේ ඒ ශ්‍රාවක සංඝ තෙම දුරසිට වුව ද ගෙනවුත් සිව්පසය පිදීමට සුදුසුය. ළඟට පමුණුවා පිදීමට සුදුසුය. දක්ෂිණාවට සුදුසුය. ඇඳිලිබැඳ වැඳීමට සුදුසුය. සියලු ලෝවැස්සන්ට අනුත්තර වූ පින් කෙතෙකැයි කියායි. මේ සංඝයා සිහි කරන නුඹලාට යම් බියක් හෝ තැති ගැන්මක් හෝ රෝමෝද්ගමනයක් හෝ වේ නම් එය දුරුවෙයි.

ඒ කවර හෙයින්ද යත් ? මහණෙනි, අර්හත් වූ සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ වනාහි පහවූ රාග ඇත්තාහ. පහවූ ද්වේෂ ඇත්තාහ. පහවූ මෝහ ඇත්තාහ. බිය නොවන සුළුය. තැති නොගන්නා  සුළුය. ත්‍රස්ත නොගන්නා  සුළුය. බයෙන් පලා නොයන සුළුය. භාග්‍යවතුන් වහන්සේ මේ ධජග්ග පිරිත වදාළ සේක. මෙසේ වදාරා සුගත නම් වූ ශාස්තෘන් වහන්සේ නැවතත් ගාථා වශයෙන් මෙයම වදාළ සේක.

08. මහණෙනි, වන සෙනසුනකදී හෝ රුක්මුල් සෙවනකදී හෝ සූන්‍යාගාරයකදී හෝ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ සිහි කරවු. එවිට නුඹලාට භයක් නොවන්නේය.

09. ඉදින් ලෝක ජේෂ්ඨ වූ නර ශ්‍රේෂ්ඨ වූ බුදුන් වහන්සේ සිහි නොකරන්නාහු නම් එකල්හි නෛර්යාණිකවූ නිවන් මඟ සලසන්නාවූ මනාකොට දෙසන ලද ධර්මය සිහිකරව්.

10. ඉදින් නිවන් සලසන්නාවූ මනා කොට දෙසන ලද ධර්මය සිහි නොකරන්නාහු නම් එවිට පුණ්‍යක්ෂේත්‍ර වූ උතුම් වූ අෂ්ටාර්ය පුද්ගල සංඝ රත්නය සිහි කරව්.

11. මහණෙනි මෙසේ බුදුරජාණන් වහන්සේ ද ධර්මය ද සංඝ රත්නය ද සිහිකරන්නා වූ නුඹලාට බියක් තැති ගැනීමක් රෝමෝද්ගමනයක් හෝ නොවන්නේය.

## ගිරිමානන්ද සුත්තං

**ඒවං මේ සුතං, ඒකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ. තේන ඛෝ පන සමයේන ආයස්මා ගිරිමානන්දෙ ආබාධිකෝ හෝති දුකඛිතෝ බාළ්හගිලානෝ. අථ ඛෝ ආයස්මා ආනන්දෙ යේන භගවා තේනුපසඞ්කම්, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං නිසීදි. ඒකමන්තං නිසින්නෝ ඛෝ ආයසමා ආනන්දෙ භගවන්තං එතදවෝචඃ ආයසමා භන්තේ ගිරිමානන්දෙ අබාධිකෝ දුකඛිතෝ බාළ්හගිලානෝ. සාධු භන්තේ, භගවා යේනා'යසමා ගිරිමානන්දෙ තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදයාති.**

**සචේ ඛෝ ත්වං ආනන්ද ගිරිමානන්දස්ස භික්ඛුනෝ උපසඞ්කමිත්වා දස සඤ්ඤා භාසෙයායාසි. ඨානං ඛෝ පනේතං විජ්ජති යං ගිරිමානන්දස්ස භික්ඛුනෝ දසසඤ්ඤා සුත්වා සෝ ආබාධෝ ඨානසෝ පටිපපස්සම්භෙයය. කතමා දස : අනිච්ච සඤ්ඤා , අනත්ත සඤ්ඤා , අසුභ සඤ්ඤා ආදීනව සඤ්ඤා , පහාන සඤ්ඤා , විරාග සඤ්ඤා, නිරෝධ සඤ්ඤා , සබ්බලෝකේ අනභිරත සඤ්ඤා , සබ්බ සඞ්ඛාරේසු අනිච්ච සඤ්ඤා , ආනාපානසති.**

**කතමා චා'නන්ද, අනිච්ච සඤ්ඤා ? ඉධා'නන්ද භිකඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ වා ඉතිපටිසඤ්චික්ඛතිඃ රූපං අනිච්චං, වේදනා අනිච්චා, සඤ්ඤා අනිච්චා, සඞ්ඛාරා අනිච්චා, විඤ්ඤාණං අනිච්චන්ති. ඉති ඉමේසු පඤ්චසුපාදනක්ඛන්ධෙසු අනිච්චානුපසසී විහරති. අයං වුච්චතා'නන්ද අනිච්ච සඤ්ඤා.**

**කතමා චා'නන්ද අනත්ත සඤ්ඤා ? ඉධා'නන්ද භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාර ගතෝ වා ඉතිපටිසංචික්ඛතිඃ චක්ඛුං අනත්තා, රූපං අනත්තා, සෝතං අනත්තා, සද්දා අනත්තා, ඝාණං අනත්තා, ගන්ධා අනත්තා, ජිව්හා අනත්තා, රසා අනත්තා, කායෝ අනත්තා, ඵොට්ඨබ්බා අනත්තා, මනෝ අනත්තා, ධම්මා අනත්තාති. ඉති ඉමේසු ඡසු අජ්ඣත්තික බාහිරේසු ආයතනේසු අනත්තානුපස්සී විහරති. අයං වුච්චතා'නන්ද අනත්තසඤ්ඤා.**

කතමා චා'නන්ද අසුභ සඤ්ඤා? ඉධා'නන්ද භික්ඛු ඉමමේව කායං උද්ධං පාදතලා අධෝ කේසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනෝ පච්චවෙක්ඛති. අත්ථි ඉමස්මිං කායේ කේසා, ලෝමා, නඛා, දන්තා, තචෝ, මංසං, නහාරු, අට්ඨී, අට්ඨිමිඤ්ජා, වක්කං, හදයං, යකනං, කිලෝමකං, පිහකං, පප්ඵාසං, අන්තං, අන්තගුණං, උදරියං, කරීසං, පිත්තං, සෙම්හං, පුබ්බෝ, ලෝහිතං, සේදෝ, මේදෝ, අස්සු, වසා, ඛේලෝ, සිංඝානිකා, ලසිකා, මුත්තන්ති. ඉති ඉමස්මිං කායේ අසුභානුපස්සී විහරති. අයං වුචචතා'නන්ද අසුභසඤ්ඤා.

කතමා චා'නන්ද ආදීනවසඤ්ඤා? ඉධා'නන්ද භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාර ගතෝ වා ඉතිපටිසංචික්ඛති. බහු දුක්ඛෝ ඛෝ අයං කායෝ බහු ආදීනවෝ. ඉති ඉමස්මිං කායේ විවිධා ආබාධා උප්පජ්ජන්ති. සෙය්‍යථීදං:
චක්ඛුරෝගෝ, සෝතරෝගෝ, ඝාණ රෝගෝ, ජිව්හා රෝගෝ, කාය රෝගෝ, සීස රෝගෝ, කණ්හ රෝගෝ, මුඛ රෝගෝ, දන්ත රෝගෝ, කාසෝ, සාසෝ, පිනාසෝ, ඩහෝ, ජරෝ, කුච්ඡිරෝගෝ. මුච්ඡා, පක්ඛන්දිකා, සූලා, විසූචිකා, කුට්ඨං, ගණ්ඩෝ, කිලාසෝ, සෝසෝ, අපමාරෝ, දද්දු, කණ්ඩු, කච්ඡු, රඛසා, විතච්ඡිකා, ලෝහිතපිත්තං, මධුමේහෝ, අංසා, පිළකා, භගන්දලා, පිත්තසමුට්ඨානා, ආබාධා, සෙම්හසමුටඨානා ආබාධා, වාතසමුට්ඨානා ආබාධා, සන්නිපාතිකා ආබාධා, උතුපරිනාමජා ආබාධා, විසමපරිහාරජා ආබාධා, ඕපක්කමිකා ආබාධා, කම්මවිපාකජා ආබාධා, සීතං, උණ්හං, ජිඝච්ඡා, පිපාසා, උච්චාරෝ, පස්සාවෝති. ඉති ඉමස්මිං කායේ ආදීනවානුපස්සී විහරති. අයං වුචචතා'නන්ද ආදීනවසඤ්ඤා.

කතමා චා'නන්ද පහාන සඤ්ඤා? ඉධා'නන්ද භික්ඛු උප්පන්නං කාම විතක්කං නාධිවාසේති, පජහති, විනෝදේති, බ්‍යන්තීකරෝති, අනභාවං ගමේති, උප්පන්නං ව්‍යාපාද විතක්කං, නාධිවාසේති පජහති, විනෝදේති, බ්‍යන්තීකරෝති, අනභාවං ගමේති, උප්පන්නං විහිංසා විතක්කං නාධිවාසේති, පජහති, විනෝදේති, බ්‍යන්තීකරෝති අනභාවං ගමේති. උප්පන්නුප්පන්නේ පාපකේ අකුසලේ ධම්මේ නාධිවාසේති, පජහති, විනෝදේති, බ්‍යන්තීකරෝති, අනභාවං ගමේති. අයං චුච්චතා'නන්ද පහාන සඤ්ඤා.

කතමා චා'නන්ද විරාගසඤ්ඤා ?. ඉධා'නන්ද භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ වා ඉති පටිසංචික්ඛති. ඒතං සන්තං ඒතං පණීතං යදිදං සබ්බ සඞ්ඛාරසමථෝ සබ්බූපධිපටිනිස්සග්ගෝ තණ්හක්ඛයෝ විරාගෝ නිබ්බානන්ති. අයං වුච්චතා'නන්ද විරාග සඤ්ඤා.

කතමා චා'නන්ද නිරෝධසඤ්ඤා ?. ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ වා ඉති පටිසඤ්චික්ඛති. ඒතං සන්තං ඒතං පණීතං යදිදං සබ්බ සඞ්ඛාරසමථෝ සබ්බූපධිපටිනිස්සග්ගෝ තණ්හක්ඛයෝ නිරෝධෝ නිබ්බානන්ති. අයං වුච්චතා'නන්ද නිරෝධ සඤ්ඤා.

කතමාචා'නන්ද සබ්බලෝකේ අනභිරතසඤ්ඤා ? ඉධා'නන්ද භික්ඛු යේ ලෝකේ උපායුපාදානා චේතසෝ අධිට්ඨානාභිනි-වේසානුසයා තේ පජහන්තෝ විරමති න උපාදියන්තෝ අයං වුච්චතා'නන්ද සබ්බලෝකේ අනභිරතසඤ්ඤා.

කතමා චා'නන්ද සබ්බසඞ්ඛාරේසු අනිච්චසඤ්ඤා? ඉධා'-නන්ද භික්ඛු සබ්බසඞ්ඛාරේහි අට්ටීයති, හරායති, ජිගුච්ඡති. අයං වුච්චතා'නන්ද සබ්බසඞ්ඛාරේසු අනිච්චසඤ්ඤා.

කතමා චා'නන්ද ආනාපානසති? ඉධා'නන්ද භික්ඛු අරඤ්ඤ ගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාර ගතෝ වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා සෝ සතෝ ව අස්සසති සතෝ පස්සසති, දීඝං වා අස්සසන්තෝ දීඝං අස්සසාමී'ති පජානාති. දීඝං වා පස්සසන්තෝ දීඝං පස්සසාමී'ති පජානාති. රස්සං වා අස්සසන්තෝ රස්සං අස්ස-සාමී'ති පජානාති. රස්සං වා පස්සසන්තෝ, රස්සං පස්සසාමී'ති පජානාති. සබ්බකායපටිසංවේදී අස්ස සිස්සාමී'ති සික්ඛති. සබ්බකාය පටිසංවේදී පස්සසිස්සාමී'ති සික්ඛති. පස්සම්භයං කායසඞ්ඛාරං, අස්සසිස්සාමී'ති සික්ඛති. පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමී'ති සික්ඛති. පීතිපටිසංවේදී අස්සසිස්සාමී'ති සික්ඛති. පීතිපටිසංවේදී පස්සසිස්සාමී'ති සික්ඛති. සුඛපටිසංවේදී අස්සසිස්සාමී'ති සික්ඛති. සුඛ පටිසංවේදී පස්සසිස්සාමී'ති සික්ඛති. චිත්තසඞ්ඛාර පටිසංවේදී අස්සසිස්සාමී'ති සික්ඛති. චිත්තසඞ්ඛාර පටිසංවේදී පස්සසිස්සාමී'ති සික්ඛති. පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සසිස්සාමී'ති සික්ඛති. පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සසිස්සාමී'ති සික්ඛති. චිත්ත පටිසං-වේදී, අස්සසිස්සාමී'ති සික්ඛති. චිත්ත පටිසංවේදී පස්සසිස්සාමී'ති සික්ඛති. අභිප්පමෝදයං චිත්තං, අස්සසිස්සාමී'ති සික්ඛති. අභිප්ප-මෝදයං චිත්තං, පස්සසිස්සාමී'ති සික්ඛති. සමාදහං චිත්තං, අස්සසිස්සාමී'ති සික්ඛති. සමාදහං චිත්තං, පස්සසිස්සාමී'ති සික්ඛති. විමෝචයං චිත්තං අස්සසිස්සාමී'ති සික්ඛති. විමෝචයං චිත්තං පස්සසිස්සාමී'ති සික්ඛති. අනිච්චානුපස්සී, අස්සසිස්සාමී'ති සික්ඛති. අනිච්චානුපස්සී, පස්සසිස්සාමී'ති සික්ඛති. විරාගානුපස්සී, අස්සසිස්-සාමී'ති සික්ඛති. විරාගානුපස්සී, පස්සසිස්සාමී'ති සික්ඛති. නිරෝධානු-පස්සී, අස්සසිස්සාමී'ති සික්ඛති. නිරෝධානුපස්සී, පස්සසිස්සාමී'ති සික්ඛති. පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති. පටිනිස්සග්-

ගානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති. අයං වුච්චතා'නන්ද ආනාපානසති.

සචේ ඛෝ ත්වං ආනන්ද ගිරිමානන්දස්ස භික්ඛුනෝ, උපසඞ්කමිත්වා ඉමා දස සඤ්ඤා භාසෙය්‍යාසි. ඨානං ඛෝ පනේතං විජ්ජති, යං ගිරිමානන්දස්ස භික්ඛුනෝ ඉමා දස සඤ්ඤා සුත්වා, සෝ ආබාධෝ ඨානසෝ පටිප්පස්සම්භෙය්‍යාති.

අථ ඛෝ ආයස්මා ආනන්දෝ භගවතෝ සන්තිකේ ඉමා දස සඤ්ඤා උග්ගහෙත්වා යේනා'යස්මා ගිරිමානන්දෝ තේනුපසඞ්කමි. උපසඞ්ක-මිත්වා ආයසමතෝ ගිරිමානන්දස්ස, ඉමා දසසඤ්ඤා අභාසි. අථ ඛෝ ආයස්මතෝ ගිරිමානන්දස්ස ඉමා දසසඤ්ඤා සුත්වා සෝ ආබාධෝ, ඨානසෝ පටිප්පස්සම්භි. වුට්ඨාහි චා'යසමා ගිරිමානන්දෝ, තම්හා ආබාධා. තථා පහීනෝ ච පනා'යස්මතෝ ගිරිමානන්දස්ස, සෝ ආබාධෝ අහෝසී'ති.

## ආරක්ෂක පිරිත් සජ්ඣායනා.

01. විපස්සිස්ස නමත්ථු - චක්ඛුමන්තස්ස සිරීමතෝ,
සිඛිස්සපි නමත්ථු - සබ්බභූතානුකම්පිනෝ.

02. වෙස්සභුස්ස නමත්ථු - නහාතකස්ස තපස්සිනෝ,
නමත්ථු කකුසන්ධස්ස - මාරසේනාපමද්දිනෝ.

03. කෝණාගමනස්ස නමත්ථු - බ්‍රාහ්මණස්ස වුසීමතෝ,
කස්සපස්ස නමත්ථු - විප්පමුත්තස්ස සබ්බධී.

04. අඞ්ගීරසස්ස නමත්ථු - සක්‍යපුත්තස්ස සිරීමතො,
නමෝ තේසං සත්තන්නං - සම්මාසම්බුද්ධානන්'ති.

01. පඨවි බල සුන්දරී - සබ්බඤ්ඤු බෝධි මණ්ඩලං,
අසංඛෙය්‍යං මාරසේනං - ජයෝ ජයතු මංගලං

02. කකුසන්ධෝ කෝනාගමනෝ - කස්සපෝ ගෝතමෝ මුනී,
මෙත්තෙය්‍යෝ පඤ්ච බුද්ධා තේ - සීසේ මේ සෙන්තු සබ්බදා

03. ඒතේසං ආනුභාවේන - යක්ඛා දේවා මහිද්ධිකා,
සබ්බේපි සුඛිතා හොන්තු - මම මිත්තා සහායකා.

04. සම්බුද්ධේ අට්ඨ වීසංච - ද්වාදසංච සහස්සකේ,
පංච සත සහස්සානී - නමාමි සිරසා දරං.

05. අප්පකා වාලුකා ගංගා - අනන්තා නිබ්බුතා ජිනා,
තේසං ධම්මංච සංඝංච - ආදරේන නමාමහං.

06. නමස්කාරානුභාවේන - හිත්වා සබ්බේ උපද්දවේ,
අනේකා අන්තරායාපි - විනස්සන්තු අසේසතෝ.

## බොජ්ඣංග පරිත්තං

බොජ්'ඣංගෝ සතිසංඛාතෝ - ධම්මානං විචයෝ තථා,
විරියං පීති පස්සද්ධි - බොජ්'ඣංගා ච තථා'පරේ.

සමාධු'පෙක්ඛබොජ්'ඣංගා - සත්'තේතේ සබ්බ දස්සිනා,
මුනිනා සම්මදක්ඛාතා - භාවිතා බහුලීකතා.

සංවත්තන්ති අභිඤ්ඤාය - නිබ්බානාය ච බෝධියා,
ඒතේන සච්ච වජ්ජේන - සොත්ථි 'තේ' හෝතු සබ්බදා.

ඒකස්මිං සමයේ නාථෝ - මොග්ගල්ලානඤ්ච කස්සපං,
ගිලානේ දුක්ඛිතේ දිස්වා - බොජ්'ඣංගේ සත්තදේසයි.

තේච නං අභිනන්දිත්වා - රෝගා මුච්චිංසු තංඛණේ,
ඒතේන සච්ච වජ්ජේන - සොත්ථි 'තේ' හෝතු සබ්බදා.

ඒකදා ධම්මරාජා පි - ගේලඤ්ඤේනාභිපීළිතෝ,
චුන්දත්ථේරේන තංයේව - භණාපෙත්වාන සාදරං;

සම්මෝදිත්වා ච ආබාධා - තම්හා වුට්ඨාසි ඨානසෝ,
ඒතේන සච්ච වජ්ජේන - සොත්ථි 'තේ' හෝතු සබ්බදා.

පහීනා තේ ච ආබාධා - තිණ්ණන්නම්පි මහේසිනං,
මග්ගා'හත කිලේසා ච - පත්තානුප්පත්ති ධම්මතං,
ඒතේන සච්ච වජ්ජේන - සොත්ථි 'තේ' හෝතු සබ්බදා.

## ඛේමාඛේම සරණ ගමන පරිදීපිකා ගාථා

01. බහුං වේ සරණං යන්ති - පබ්බතානි වනානි ච,
ආරාමරුක්ඛචේත්‍යානි - මනුස්සා භයතජ්ජිතා.

බියෙන් තැතිගත් මිනිසුන් පර්වතද, වනද, ආරාමවෘක්ෂ චෛත්‍යයන්ද බොහෝ සෙයින් සරණ කොට යත්.

02. නේතං ඛෝ සරණං ඛේමං - නේතං සරණමුත්තමං,
නේතං සරණමාගම්ම - සබ්බදුක්ඛා පමුච්චති.

එහෙත් ඒ කිසිවක් බිය රහිත නොවේ. උතුම්ද නොවේ.මේ කිසිවක් සරණ කොට ගොස් සියළු දුකින් මිදීමට නොහැකි වේ.

**03. යෝ ච බුද්ධඤ්ච ධම්මඤ්ච - සඞ්ඝඤ්ච සරණං ගතෝ,**
**චත්තාරි අරියසච්චානි - සම්මප්පඤ්ඤාය පස්සති.**

යමෙක් බුදුන් දහම් හා සඟුන් සරණයයි ද, චතුරාර්‍ය්‍ය සත්‍ය මනා නුවණින් දකීද ,

**04. දුක්ඛං දුක්ඛසමුප්පාදං - දුක්ඛස්ස ච අතික්කමං,**
**අරියං චට්ඨඞ්ගිකං මග්ගං - දුක්ඛූපසමගාමිනං.**

දුකද , දුකට හේතුවද , දුක සංසිඳීමද , දුක් සංසිඳීමේ මඟවූ ආර්‍ය්‍යඅෂ්ඨාංගික මාර්ගය ද යන,

**05. ඒතං ඛෝ සරණං ඛේමං - ඒතං සරණමුත්තමං,**
**ඒතං සරණමාගම්ම - සබ්බදුක්ඛා පමුච්චති.**

මෙය ඒකාන්තයෙන්ම බිය රහිත වූ පිහිටය. මෙය ම උතුම් පිහිට වේ. තෙරුවන් සරණයාම සහ චතුරාර්‍ය්‍ය සත්‍යාවබෝධය යන මෙයම පිහිට කරගෙන ඒ තැනැත්තා දුකින් මිදේ.

**( ඛු.නි. ධම්ම පද පාළි - බුද්ධ වග්ග)**

## අරියධන ගාථා

**01. යස්ස සද්ධා තථාගතේ - අචලා සුප්පතිට්ඨිතා,**
**සීලඤ්ච යස්ස කල්‍යාණං - අරියකන්තං පසංසිතං.**

යමෙකුට තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව අචලව මැනවින් පිහිටියාද, යමෙකුගේ යහපත් වූ සීලය ආර්‍ය්‍යකාන්ත වූයේ පසස්නා ලද්දේද,

**02. සංඝේ පසාදෝ යස්සත්ථි - උජුභූතඤ්ච දස්සනං,**
**අදලිද්දෝති තං ආහු -අමෝඝං තස්ස ජීවිතං.**

යමෙකුට සඞ්ඝයා කෙරෙහි පැහැදීම ඇත්තේද, ඥානදර්ශණයත් සෘජු වූයේ වේද , ඔහු නො දිළින්දෙකැයි (බුද්ධාදි උතුමෝ)කියති. ඔහුගේ ජීවිතය හිස් නොවේ.

**03. තස්මා සද්ධඤ්ච සීලඤ්ච - පසාදං ධම්මදස්සනං,**
**අනුයුඤ්ජේථ මේධාවී - සරං බුද්ධාන සාසන'න්ති.**

එහෙයින් ප්‍රාඥ තෙමේ බුදුවරයන්ගේ ශාසනය සිහිකරන්නේ ශ්‍රද්ධාවද ශීලයද , පැහැදීමද, ධර්‍මය දැකීමද, අනුයෝග වශයෙන් පිරිසිදු කරන්නේය.

**( ස.නි. සගාථා වග්ග. -සක්ක සංයු. - දලිද්ද සුත්ත )**

## තිලක්ඛණාදි ගාථා

**01. සබ්බේ සංඛාරා අනිච්චාති - යදා පඤ්ඤාය පස්සති,**
**අථ නිබ්බින්දතී දුක්ඛේ - ඒස මග්ගෝ සුද්ධියා.**

සියළු සංස්කාරයයන් අනිත්‍යය'යි නුවණින් දැනගත්විට දුක ගැන කලකිරේ. මේ කලකිරීම කෙලෙසුන් කෙරෙන් පිරිසිදු වීමට නිවන් ලැබීමට මඟය.

**02. සබ්බේ සංඛාරා දුක්ඛාති - යදා පඤ්ඤාය පස්සති,**
**අථ නිබ්බින්දතී දුක්ඛේ - ඒස මග්ගෝ සුද්ධියා.**

සියළු සංස්කාරයයන් දුක් යැ'යි නුවණින් දැනගත්විට දුක ගැන කලකිරේ. මේ කලකිරීම කෙලෙසුන් කෙරෙන් පිරිසිදු වීමට නිවන් ලැබීමට මඟය.

**03. සබ්බේ ධම්මා අනත්තාති - යදා පඤ්ඤාය පස්සති,**
**අථ නිබ්බින්දතී දුක්ඛේ - ඒස මග්ගෝ සුද්ධියා.**

සියළු සංස්කාරයයන් ආත්මයෙන් තොරයැ'යි නුවණින් දැනගත්විට දුක ගැන කලකිරේ. මේ කලකිරීම කෙලෙසුන් කෙරෙන් පිරිසිදු වීමට නිවන් ලැබීමට මඟය.

**04. අප්පකාතේ මනුස්සේසු - යේ ජනා පාරගාමිනෝ,**
**අථායං ඉතරා පජා - තීරමේවානුධාවතී.**

මිනිසුන් අතර නිවනට යන්නෝ ස්වල්ප දෙනෙකි. සෙසු මිනිස්සු මෙතෙර නැමැති සසරේම දුවත්.

**05. යේ ච ඛෝ සම්මදක්ඛාතේ - ධම්මේ ධම්මානුවත්තිනෝ,**
**තේ ජනා පාරමෙස්සන්ති - මච්චුධෙය්‍යං සුදුත්තරං.**

මනාකොට දෙසූ ධර්මයට අනුව පිළිපදින ඇත්තෝ මහත් අමාරුවෙන් එතෙර වියයුතු සංසාර සාගරය තරණය කොට නිවනට යන්නෝය.

**06. කණ්හං ධම්මං විප්පහාය - සුක්කං භාවේථ පණ්ඩිතෝ,**
**ඕකා අනෝකං ආගම්ම - විවේකේ යත්ථ දූරමං,**

නුවණැත්තා සසර හැරදමා සිත් ඇලවීමට දුෂ්කරවූ, නිවන් පිණිස කුසල් වැඩිය යුතුය.

## භද්දේකරත්ත ගාථා

**01. අතීතං නාන්වාගමෙය්‍ය - නප්පටිකඞ්ඛේ අනාගතං,**
**යදතීතං පහීනං තං - අප්පත්තඤ්ච අනාගතං.**

අතීතය පිළිබඳව නොතැවිය යුතුය. අනාගතය පිළිබඳව නොසිතිය යුතුය. යම් හෙයකින් යමක් අතීතද එය ප්‍රහීනව ඇත. අනාගතය තවම එළඹ නැත.

**02. පච්චුප්පන්නඤ්ච යෝ ධම්මං - තත්ථ තත්ථ විපස්සති,**
**අසංහීරං අසංකුප්පං - තං විද්වා මනුබ්‍රෑහයේ.**

ප්‍රත්‍යුප්පන්න වූ ධර්මස්වභාවයන් ඒ ඒ මොහොතේදීම විදසුන් නුවනින් දකීද එවැනි විද්වත් තෙමේ නොගැලුනු නොසෙල්වුනු විදසුන් නුවණ වඩන්නේය.

**03. අජ්ජේව කිච්ච ආතප්පං - කෝ ජඤ්ඤා මරණං සුවේ,**
**න හි නො සඞ්ගරං තේන - මහාසේනේන මච්චුනා.**

අප්‍රමාදීව ආතාප වීරියෙන් යුක්තව කටයුතු කළයුතුය. හෙට මරණය පැමිණෙන්නේ යැයි කවරෙක් දනීද ? මහාසේනා ඇති මරුන් සමඟ කවරනම් මිත්‍ර සන්ධානයක්ද ?

**04. ඒවං විහාරි ආතාපිං - අහෝරත්තමතන්දිතං,**
**තං වේ භද්දේකරත්තෝති - සන්තෝ ආචික්ඛතේ මුනී.**

මෙබඳු විහරණ ඇති, ආතාපි වීර්යයෙන් යුතු, දිවා රෑ දෙක්හි අනලස් වූ ඒ පුඟුලා 'භද්දේක රත්ත යැ' යි බුද්ධ මුනි ප්‍රකාශ කෙරේ.

**( ම.නි. උපරි ප. - භද්දේකරත්ත සුත්ත )**

# සුගතෝවාදය.

අප්පමාදේන භික්ඛවේ සම්පාදේථ, දුල්ලභෝ බුද්ධුප්පාදෝ ලෝකස්මිං, දුල්ලභෝ මනුස්සත්ත පටිලාභෝ, දුල්ලභා ඛණ සම්පත්තී, දුල්ලභා පබ්බජ්ජා, දුල්ලභං සද්ධම්ම සවණං,දුල්ලභෝ සප්පුරිස සංසේවෝ’ති. ආරභථ,නික්ඛමථ,යුඤ්ජථ බුද්ධ සාසනේ ධුනාථ මච්චුනෝසේනං නළාගාරං ව කුඤ්ජරෝ. යෝ ඉමස්මිං ධම්ම විනයේ අප්පමත්තෝ විහෙස්සතී, පහාය ජාති සංසාරං දුක්ඛස්සන්තං කරිස්සති.

# පච්ඡිම ඕවාද ගාථා

01. පරිපක්කෝ වයෝ මයිහං - පරිත්තං මම ජීවිතං,
පහාය වෝ ගමිස්සාමි - කතං මේ සරණමත්තනෝ.

මගේ වයස මුහුකෙළේය. මගේ ජීවිත කාලය (තව) ස්වල්පයකි. තොප හැර යන්නෙමි. මා විසින් තමහට පිහිට කරන ලද්දේය.

02. අප්පමත්තා සතීමන්තෝ - සුසීලා හෝථ භික්ඛවෝ,
සුසමාහිත සඞ්කප්පා - සචිත්තමනුරක්ඛථ.

මහණෙනි, නොපමා වවු, සිහි ඇත්තෝ වවු, සුසිල්වත් වවු, මොනවට පිහිටුවූ සම්‍යක් කල්පනා ඇත්තෝ තමන් සිත රැකගනිවු.

03. යෝ ඉමස්මිං ධම්ම විනයේ - අප්පමත්තෝ විහෙස්සති,
පහාය ජාති සංසාරං - දුක්ඛස්සන්තං කරිස්සතී’’ති.

යමෙක් මේ සස්නෙහි නොපමාව වෙහෙසෙන්නේ නම්, හෙතෙම ජාති සංසාරය හැරැ ලා දුක් කෙළවර කරන්නේය.

( දී.නි. මහා වග්ග. - මහාපරිනිර්වාණ සුත්ත )

# ජය පිරිත

සිරි ධිති මති තේජෝ ජයසිද්ධි මහිද්ධි මහා ගුණං අපරිමිත පුඤ්ඤාධිකාරස්ස සබ්බන්තරාය නිවාරණ සමත්ථස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස. ද්වත්තිංස මහා පුරිස ලක්ඛණානුභා-වේන අසීත්‍යනුබ්‍යඤ්ජන ලක්ඛණානුභාවේන, අට්ඨුත්තරසතමංගල

ලක්ඛණානුභාවේන, ඡබ්බණ්ණරංසයානුභාවේන, කේතුමාලානුභාවේන, දසපාරමිතානුභාවේන, දස උපපාරමිතානුභාවේන, දස පරමත්ථ පාරමිතානුභාවේන, සීල සමාධි පඤ්ඤානුභාවේන, බුද්ධානුභාවේන, ධම්මානුභාවේන, සංඝානුභාවේන, තේජානුභාවේන, ඉද්ධ්‍යානුභාවේන, බලානුභාවේන, ඤෙය්‍යධම්මානුභාවේන, චතුරාසීති සහස්සධම්මක්ඛන්ධානුභාවේන, නව ලෝකුත්තර ධම්මානුභාවේන, අට්ඨංගිකමග්ගානු-භාවේන, අට්ඨසමාපත්‍යානුභාවේන, ඡළභිඤ්ඤානුභාවේන, මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛානුභාවේන, සබ්බ පාරමිතානුභාවේන, රතනත්තය සරණානුභාවේන, තුය්හං සබ්බ රෝග සෝක උපද්දව දුක්ඛ දෝමනස්සුපායාසා විනස්සන්තු. සබ්බසංකප්පා තුය්හං සම්ජ්ඣන්තු. දීඝායුකෝ හෝතු සත වස්සජීවේන සමංගිකෝ හෝතු සබ්බදා.

ආකාස පබ්බත වන භූමි තටාක ගංගා මහා සමුද්ද ආරක්ඛක දේවතා සදා තුම්හේ අනුරක්ඛන්තු. සබ්බ බුද්ධානුභාවේන, සබ්බ ධම්මානුභාවේන, සබ්බ සංඝානුභාවේන, බුද්ධ රතනං, ධම්ම රතනං, සංඝ රතනං, තිණ්ණං රතනානං ආනුභාවේන, චතුරාසීති සහස්ස ධම්මක්ඛන්ධානුභාවේන පිටකත්තයානුභාවේන, ජින සාවකානු භාවේන, සබ්බේ තේ රෝගා, සබ්බේ තේ භයා, සබ්බේ තේ අන්තරායා, සබ්බේ තේ උපද්දවා, සබ්බේ තේ දුන්නිමිත්තා, සබ්බේ තේ අවමංගලා විනස්සන්තු. ආයුවඩ්ඪකෝ, ධනවඩ්ඪකෝ, සිරිවඩ්ඪකෝ, යසවඩ්ඪකෝ, බලවඩ්ඪකෝ, වණ්ණ වඩ්ඪකෝ, සුඛවඩ්ඪකෝ හෝතු සබ්බදා.

දුක්ඛ රෝග භයා වේරා - සෝකා සබ්බේ උපද්දවා,
අනේකා අන්තරයාපී - විනස්සන්තු ච තේජසා.

ජයසිද්ධි ධනං ලාභං - සොත්ථි භාග්‍යං සුඛං බලං,
සිරි ආයු ච වණ්ණෝ ච - භෝගං වුද්ධී ච යසවා,
සතවස්සෝ ච ආයූ ච - ජීව සිද්ධී භවන්තු තේ.

මේ පිරිත සියලු රෝගයන්ට ද යක්ෂ භයට හා ග්‍රහ දෝෂ වලටද යහපත් ය. තමාට කියාගන්නා කල්හි 'තුය්හං' යන තැනට 'මය්හං' කියා ද 'තේ' යන තැනට 'මේ' කියා ද යොදා ගත යුතුයි.

## සෙත් ගාථා

යන්දුන්නිමිත්තං අවමංගලඤ්ච
යෝ චා'මනාපෝ සකුණස්ස සද්දෝ,
පාපග්ගහෝ දුස්සුපිනං අකන්තං
බුද්ධානුභාවේන විනාසමෙන්තු.

යන්දුන්නිමිත්තං අවමංගලඤ්ච
යෝ චා'මනාපෝ සකුණස්ස සද්දෝ,
පාපග්ගහෝ දුස්සුපිනං අකන්තං
ධම්මානුභාවේන විනාසමෙන්තු.

යන්දුන්නිමිත්තං අවමංගලඤ්ච
යෝ චා'මනාපෝ සකුණස්ස සද්දෝ,
පාපග්ගහෝ දුස්සුපිනං අකන්තං
සංඝානුභාවේන විනාසමෙන්තු.

සබ්බේ බුද්ධා බලප්පත්තා - පච්චේකානඤ්ච යං බලං,
අරහන්තානඤ්ච තේජේන - රක්ඛං බන්ධාමි සබ්බසෝ.

## උද්දිස්සනාධිට්ඨාන ගාථා

01. ඉමිනා පුඤ්ඤ කම්මේන - උපජ්ඣායා ගුණුත්තරා,
ආචරියූපකාරාච - මාතාපිතා පියා මමං.

02. සුරියො චන්දිමා රාජා - ගුණවන්තා නරාපිච,
බ්‍රහ්මා මාරාච ඉන්ද්‍රාච - ලෝකපාලාච දේවතා.

03. යමෝ මිත්තා මනුස්සාච - මජ්ඣත්තාවේරිකාපිච,
සබ්බේ සත්තා සුඛී හොන්තු - පුඤ්ඤානි පකතානිමේ.

04. සුඛං ච තිවිධං දෙන්තු - ඛිප්පං පාපේථ වෝමතං,
ඉමිනා පුඤ්ඤ කම්මේන - ඉමිනා උද්දිසේනච.

05. ඛිප්පාහන්තුලහේචේ ච - තණ්හූපාදාන ඡේදනං,
යේ සන්තානේ හීනා ධම්මා - යාව නිබ්බානතො මමං.

06. නස්සන්තු සබ්බදායේව - යත්ථ ජාතෝ භවේ භවේ,
උජු චිත්තෝ සතිපඤ්ඤෝ - සල්ලේඛෝ විරිය වාමිනා.

07. මාරා ලභන්තු නෝකාසං - කාතුං ච විරියේතු මේ,
බුද්ධෝදීප වරෝ නාථෝ - ධම්මෝ නාථෝ වරුත්තමෝ.

08. නාථෝ පච්චේක සම්බුද්ධෝ - සංඝෝ නාථෝත්තරෝ මමං,
තේසෝත්තමානුභාවේන - මාරෝකාසං ලභන්තු මා.

එත්තාවතාච අම්හේහි - සම්භතං පුඤ්ඤ සම්පදං,
සබ්බේ දේවා අනුමෝදන්තු - සබ්බ සම්පත්ති සිද්ධියා,
සබ්බේ භූතා අනුමෝදන්තු - සබ්බ සම්පත්ති සිද්ධියා,

සබ්බේ සත්තා අනුමෝදන්තු - සබ්බ සම්පත්ති සිද්ධියා.

ආකාසට්ඨාච භුම්මට්ඨා - දේවානාගා මහිද්ධිකා
පුඤ්ඤං තං අනුමෝදිත්වා - චිරං රක්ඛන්තු සම්බුද්ධසාසනං.
- චිරං රක්ඛන්තු සම්බුද්ධදේසනං.
- චිරං රක්ඛන්තු සම්බුද්ධසාවකං.
- චිරං රක්ඛන්තු මං පරං.

අස්මිං විහාරේචාරාමේ - අධිවත්තාච දේවතා,
අනුමෝදිත්වා ඉමං පුඤ්ඤං - රක්ඛන්තු ජිනසාසනං.

ඉදං වෝ ඤාතීනං හෝතු - සුඛිතා හොන්තු ඤාතයෝ !!!
සබ්බේ සත්තාච මජ්ඣත්තා - හිතා ච අහිතා ච මේ,
අනුමෝදිත්වා ඉමං පුඤ්ඤං භුඤ්ජන්තු අමතං පදං.

භවග්ගුපාදාය අවීචි හෙට්ඨතෝ
එත්ථන්තරේ සත්ත කායූපපන්නා,
රූපී අරූපීච අසඤ්ඤිසඤ්ඤිනෝ
දුක්ඛා පමුච්චන්තු ඵුසන්තු නිබ්බුතිං.

දුක්ඛප්පත්තා ච නිද්දුක්ඛා
භයප්පත්තා ච නිබ්භයා,
සෝකප්පත්තා ච නිස්සෝකා
හොන්තු සබ්බේපි පාණිනෝ.

දේවෝ වස්සතු කාලේන - සස්ස සම්පත්ති හෝතුච,
පීතෝ භවතු ලෝකෝච -රාජා භවතු ධම්මිකෝ.

## ප්‍රාර්ථනා වාක්‍යය

ඉමිනා පුඤ්ඤ කම්මේන - මා මේ බාල සමාගමෝ,
සතං සමාගමෝ හෝතු - යාව නිබ්බාන පත්තියා !

නිවන් දකිනා ජාති දක්වා පස් පව් දස අකුසල් කරන බාලයන්ගේ ද අසත්පුරුෂයන්ගේ ද පාප මිත්‍රයන්ගේ ද ආශ්‍රය කිසිවිටෙක නොලැබේවා! දානාදී පින්කම් කරන, සීලාදී අනන්ත ගුණ පුරණ, සමථවිදර්ශනා භාවනා වඩන බුද්ධාදී ආර්‍ය්‍ය මහෝත්තමයාණන් වහන්සේලාගේ ද නිවනට උපකාර කරන කල්‍යාණ මිත්‍රයන්ගේ ද ආශ්‍රය ලැබේවා!

**ඉදං මේ පුඤ්ඤ කම්මං - ආසවක්ඛයා වහං හෝතු**
**සබ්බ දුක්ඛා පමුඤ්චතු !**

මා විසින් රැස් කරන ලද්දාවූ මේ කුසලසම්භාර ධර්මය ආශ්‍රවයන් ක්ෂය කොට සියලු දුකෙන් අතමිදීමෙන් ලබන ශාන්ත නිවන් සුව පිණිසම හේතු වේවා! වාසනා වේවා!

**ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා බුද්ධං පූජේමි,**
**ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා ධම්මං පූජේමි,**
**ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා සඞ්ඝං පූජේමි,**

**අද්ධා ඉමාය පටිපත්තියා ජාති ජරා මරණම්හා පරිමුච්චිස්සාමි.**

## තෙරුවන් සමාකර ගැනීම.

**කායේන වාචා චිත්තේන - පමාදේන මයා කතං,**
**අච්චයං ඛම මේ භන්තේ - භූරිපඤ්ඤ තථාගත.**

**කායේන වාචා චිත්තේන - පමාදේන මයා කතං,**
**අච්චයං ඛම මේ ධම්ම - සන්දිට්ඨික අකාලික.**

**කායේන වාචා චිත්තේන - පමාදේන මයා කතං,**
**අච්චයං ඛම මේ සඞ්ඝ - පුඤ්ඤක්ඛෙත්තඅනුත්තර.**

**සාදූ ! සාදූ ! සාදූ !**